**ලෝක උරුම නකල්ස් ජලපෝෂක ප්‍රදේශයේ අවදානමට ලක්විය හැකි ගංහාද්‍රෝණි සහ පහළ නිම්නවල වෙසෙන ගොවීන් සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - 2024**

ලෝක උරුම නකල්ස් ජලපෝෂක ප්‍රදේශයේ අවදානමට ලක්විය හැකි ගංහාද්‍රෝණි සහ පහළ නිම්නවල වෙසෙන ගොවීන් සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය එවකට වාරිමාර්ග අමාත්‍යාංශය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර පදනම (අයි.යූ.සී.එන්) අතර ඇතිකරගත් 2022 අගෝස්තු 19 දිනැති ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමේ වගන්ති 5.16 හි විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මූල්‍යයනය හා කාල රාමුව

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව වාරිමාර්ග අමාත්‍යාංශය හා ජාත්‍යන්තර කෘෂි වන වගා පර්යේෂණ සභාව (අයි.සී.ආර්.ඒ.එෆ්) ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ හා ක්‍රියාවට නැංවීමේ නියෝජිතයන් වේ. වගා සහ භූමි කළමනාකරණ පුරුදු උසස් කිරීම, ජල සුරක්ෂිතතාව ඉහල නැංවීම හා දේශගුණය හා බැඳුණු අවදානම් අවම කිරීමට පරිසර පද්ධති ආරක්ෂා කිරීම මඟින් නකල්ස් ජලපෝෂක ප්‍රදේශයේ අවදානමට ලක්විය හැකි ගංහාද්‍රෝණි සහ පහළ නිම්නවල වෙසෙන ගොවීන් සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. දේශගුණ ප්‍රතිශක්තිමත් තිරසර භූමි කළමණාකරණය, තිරසර භූමි කළමණාකරණය සඳහා ආරක්ෂිත මූල්‍ය යාන්ත්‍රණ,ආයතනික ධාරිතා ශක්තිමත් කිරීම හා ව්‍යාපෘති කළමනාකරණය යන ප්‍රධාන කොටස් හතරක් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කරයි. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 48.98 ලෙස රු.මිලියන 15,672 ක් වූ අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 39.78 ක් වූ රු.මිලියන 12,729ක් හරිත දේශගුණික අරමුදල (ජී.සී.එෆ්) විසින් මූල්‍යනය කිරීමට එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 9.2 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘතියේ කාර්යයන් 2023 අගෝස්තු 23 වන දින ආරම්භ කර 2029 ජනවාරි 16 වන දින වන විට නිමා කිරීමට සැලසුම් කර ඇත.

## 1.3 මතය වියාචනය

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 1.4 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන මතයක් ප්‍රකාශ කිරීමෙන් මම වැළකී සිටිමි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඒ සම්බන්ධයෙන් විගණන වාර්තාවක් නිකුත් කිරීම මගේ වගකීම වේ. කෙසේ වුවද, මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට අවශ්‍ය ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

# 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | වටිනාකම රු.මිලියන | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අරමුදල් සපයන ලද ක්‍රියාකාරකම් ගිවිසුමට අනුව, හරිත දේශගුණික අරමුදල (ජී.සී.එෆ්) විසින් ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 39.18 ක්, එනම් රුපියල් මිලියන 12,729 කට සමාන මුදලක් ප්‍රදානය කිරීමට එකඟ වී තිබුණි. එමෙන්ම, ව්‍යාපෘති වියදම් සඳහා හරිත දේශගුණික අරමුදල විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 10.5 ක්, එනම් රුපියල් මිලියන 3,444 කට සමාන මුදලක් කෘෂි වන වග්‍ය පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (අයි.සී.ආර්.ඒ.එෆ්) වෙත නිදහස් කර තිබුණි. කෙසේ වෙතත්, අයි.සී.ආර්.ඒ.එෆ් විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ වියදම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.<br><br>තවද, මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (පී.එම්.යූ) වෙත නිදහස් කරන ලද මුදල් පමණක් පදනම් කරගෙන වන අතර, එම මුදල | 3,444 | අයි.සී.ආර්.ඒ.එෆ් විසින් ලබාගෙන භාවිතා කරන ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 10.5 ට අදාළ මූල්‍ය ප්‍රකාශන සහ වියදම් වාර්තා, හරිත දේශගුණික අරමුදලේ (ජී.සී.එෆ්) මූල්‍ය කළමනාකරණ හා විගණන අවශ්‍යතා අනුව, අයි.යූ.සී.එන් සංවිධානයේ අධීක්ෂණය යටතේ විගණනය කරනු ලබන අතර, එම විගණනය අර්නස්ට් ඇන්ඩ් යන්ග් (ඊ.වයි) විගණකවරුන් විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, අයි.සී.ආර්.ඒ.එෆ් විසින් දරන ලද වියදම්, ප්‍රතිතන | ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කර ඇති සමස්ත ප්‍රදාන මුදල ආවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සමස්ත නිදහස් කිරීම්වලින් සියයට 73 ක් නියෝජනය කරයි. ඒ අනුව, විගණන විෂය පථය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලද කටයුතු දක්වා සීමා විය. | | ආයතනයේ ස්ථාපිත විගණන විධිවිධාන යටතේ ස්වාධීන බාහිර විගණන ක්‍රියාවලියකට යටත් වේ. එබැවින්, එම වියදම් වෙනම සමාලෝචනය කර තහවුරු කරනු ලබන අතර, ජී.සී.එෆ් නකල්ස් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොමැත. | |
| (ආ) | පෙර වර්ෂයේ වත්කම් හා වගකීම්වල අවසාන ශේෂ, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ඉදිරියට ගෙනවිත් නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ජංගම නොවන වත්කම් සහ හිමිකම් වටිනාකම රුපියල් මිලියන 26.46 කින් අවතක්සේරු වී තිබුණි. | 26.46 | මෙම ශේෂය ආරම්භක ශේෂයක් ලෙස ඉදිරියට ගෙන නොගිය බව පිළිගනිමි. | එම ශේෂයන් ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2024 වර්ෂය සඳහා මහවැලි උපදේශන කාර්යාංශයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව, ව්‍යාපෘතියෙන් ලැබිය යුතු ලෙස රුපියල් මිලියන 33.59 ක ශේෂයක් පෙන්වා තිබුණද, ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල එම කාර්යාංශයට ගෙවිය යුතු ශේෂයක් ලෙස සටහන් කර නොතිබුණි. | 33.59 | මහවැලි උපදේශන කාර්යාංශය විසින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම් වාර්තා කිරීම සඳහා යම් කාල පරාසයක් අවශ්‍ය වීම හේතුවෙන්, එවැනි වෙනස්කම් ඇතිවිය හැක. | එම ශේෂයන් සැසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | වියදම් වාර්තා සහ ලෙජර් ගිණුම්වල දක්වා ඇති වියදම් සංරචක 1, 2 සහ 3 සම්බන්ධයෙන් රුපියල් මිලියන 18.39 ක වෙනසක් නිරීක්ෂණය විය. | 18.39 | ලෙජර් ගිණුම් හා වියදම් වාර්තා අතර වෙනස්කම් පැවතිය හැක. | ශේෂයන් සැසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ලේඛනයේ 92 ඡේදය | ව්‍යාපෘති මෙහෙයුම් සම්බන්ධ තීරණ ගනු ගැනීම සඳහා ව්‍යාපෘති මණ්ඩලයක් පිහිටුවා තිබිය යුතුය. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති මණ්ඩලයක් ස්ථාපිත කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2024 ජූනි 21 දිනැති අංක DMA/1/2024 අංකය දරන අවදානම් කළමනාකරණ චක්‍රලේඛය | ව්‍යාපෘතිය සඳහා අවදානම් කළමනාකරණ කමිටු පත්කර නොතිබුණි. | පත්කිරීම ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | ව්‍යාපෘති අවදානම් කළමනාකරණ කමිටුවක් පත් කළ යුතුය. |
| (ඇ) | 2024 ජනවාරි 10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024. | | | |
| | (i) 5.2 වගන්තිය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව, සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ පුහුණු වැඩසටහන් සඳහා රුපියල් මිලියන 6.11ක මුදලක් වැය කර ඇති බව නිරීක්ෂණය විය. | මෙය ක්‍රියාත්මක කිරීමේ හවුල්කරු වන මහවැලි උපදේශන කාර්යාංශය විසින් සිදු කර ඇති බැවින්, අදාළ තොරතුරු ඔවුන්ගෙන් සෘජුවම ලබාගත යුතුය. | ජාතික අයවැය චක්‍රලේඛය දැඩිව අනුගමනය කළ යුතුය. |
| | (ii) 6 වගන්තිය | විදේශීය අනුග්‍රාහක ආයතන විසින් සම්පූර්ණ වියදම දරන අවස්ථාවලදී හැර, නිලධාරීන් විදේශීය අධ්‍යයන, පුහුණුවීම්, සාකච්ඡා, සම්මන්ත්‍රණ හෝ සංචාර සඳහා සහභාගී නොවිය යුතුය. එහෙත්, මෙම විධිවිධානයට පටහැනිව, ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2024 අප්‍රේල් 21 සිට 27 දක්වා මැලේසියාවේ පැවති කාබන් වෙළඳාම සහ දේශගුණික විපර්යාස පිළිබඳ අයි.ආර්.ආර්.ඩී.බී වැඩමුළුවට සහභාගී වී ඇති අතර, ඒ සඳහා ව්‍යාපෘති අරමුදලින් රුපියල් 1,483,879.60 ක් වැය කර තිබුණි. | එම අවස්ථාවේදී අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීන් විදේශ සංචාරවල නිරතව සිටි බැවින්, මෙම කාර්යය සඳහා ව්‍යාපෘතියේ ප්‍රධාන අයවැයෙන් විදේශීය පුහුණු සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන භාවිතා කර ඇත. | ජාතික අයවැය චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කළ යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ලේඛනයට අනුව, පළමු වර්ෂය තුළ ඇමෙරිකානු ඩොලර් 1,458,504 ක වටිනාකමින් යුත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමටත්, 2024 දෙසැම්බර් 31 වන විට ඇමෙරිකානු ඩොලර් 14,878,965 ක සමුච්චිත වටිනාකමින් යුත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන විට දරා තිබූ වියදම රුපියල් 437,551,232 ක් වූ අතර, එය ඇමෙරිකානු ඩොලර් 1,414,358 කට සමාන විය. එය 2024 වර්ෂය දක්වා අපේක්ෂිත වියදමෙන් සියයට 9.8 ක් පමණක් නියෝජනය කළේය. | මානව සම්පත් හිඟය සහ භාණ්ඩාගාරයෙන් අත්තිකාරම් මුදල් ලැබීමේ ප්‍රමාදය හේතුවෙන්, වාර්තාකරණ කාලසීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වේගවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ප්‍රධාන පාර්ශ්වකරුවන් ලෙස හඳුනාගෙන තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව රුපියල් මිලියන 907.02 ක් වෙන් කිරීමට සැලසුම් කර තිබූ අතර, 2024 වර්ෂය තුළ මෙම ආයතන සඳහා රුපියල් මිලියන 264.9 ක් නිකුත් කර තිබුණද, එකඟ වූ ක්‍රියාකාරකම් නියමිත ලෙස සිදු නොකිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 වන විට රුපියල් මිලියන 77 ක් ව්‍යාපෘතියට නැවත ආපසු ලබාදී තිබුණි. | ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී, ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා ක්‍රියාත්මක කරන හවුල්කරුවන් වෙත අරමුදල් නිකුත් කර තිබුණි. | සියලුම පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය සහ සන්නිවේදන යාන්ත්‍රණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා සේවා සැපයුම්කරු ලෙස මහවැලි උපදේශන කාර්යාංශ (පුද්ගලික) | ව්‍යාපෘති කළමනාකරණය විසින් ඉල්ලීමක් කරන අවස්ථාවලදී, එම්.සී.බී ආයතනය විසින් උපදේශකයින් සහ අනෙකුත් කාර්ය | ව්‍යාපෘති අරමුදල් කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාගම තෝරාගෙන තිබුණද, අනුමත කරන ලද කාර්ය සැලැස්මක් හා ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිව එම කාර්යාංශයට අරමුදල් නිකුත් කර තිබුණි. සමාලෝචනයට ලක් වූ වර්ෂය තුළ විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා එම සමාගමට රුපියල් මිලියන 128.83 ක් නිකුත් කර ඇති අතර, එයින් රුපියල් මිලියන 95.24 ක් වියදම් කර තිබූ අතර, 2024 දෙසැම්බර් 31 වන විට රුපියල් මිලියන 33.59 ක් පමණ භාවිත නොකර ඉතිරිව තිබුණි. | මණ්ඩල සාමාජිකයින් ව්‍යාපෘතියට සපයනු ලැබේ. | |
| (ඇ) | ඉඩම් හා ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම, මූල්‍ය ස්ථායීතාවය ස්ථාපිත කිරීම සහ රජයේ සහාය ශක්තිමත් කිරීම යන ප්‍රධාන සංරචක තුනක් හරහා ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. එහෙත්, 2024 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 6 ක් වැනි ඉතා අඩු මට්ටමක් බව වාර්තා වී තිබුණි. | පාර්ශ්වකරුවන් වන රජයේ ආයතන විසින්ද අමතර ව්‍යාපෘති වැඩ කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති බව පෙන්වා දී ඇත. මෙම හේතූන් නිසා, අපේක්ෂිත ප්‍රගති මට්ටම ලබා ගැනීම ඉතා දුෂ්කර වී ඇත. | සියලුම පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය සහ සන්නිවේදන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නකල්ස් ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන පාර්ශ්වකරුවෙකු ලෙස තෝරාගෙන තිබුණ අතර 2024 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා රුපියල් මිලියන 126.12 ක් අනුමත කර තිබුණ අතර සමාලෝචිත වර්ෂය තුළ එම මුදලින් රුපියල් මිලියන 37.18 ක් පමණක් වියදම් කර තිබුණි. විගණිත දිනය වන විට ව්‍යාපෘතිය හා එම අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. තවද, ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දිගුකාලීන තොරතුරු අවබෝධ කර ගැනීමට අවශ්‍ය මූලික අධ්‍යයනයක්ද අධිකාරිය විසින් සිදු කර නොතිබුණි. | දැනට මූලික අධ්‍යයන 51ක් අවසන් කර ඇත.නව මූලික අධ්‍යයන 450ක් ආරම්භ කිරීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. | ක්‍රියාත්මක කිරීමේ සැලසුම් කඩිනම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2024 වර්ෂයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් ඇල්කඩුව වැව්ලි සමාගමට රුපියල් මිලියන 37.60 ක් වාරික තුනකින් ලබා දී තිබුණි. විගණිත දිනය වූ 2025 ඔක්තෝබර් 07 වන විට එයින් රුපියල් මිලියන 25.38 ක් වියදම් කර ඇති අතර, රුපියල් මිලියන 12.22 ක ශේෂයක් ඉතිරිව තිබුණි. ඒ අනුව, විගණිත දින වන විට ව්‍යාපෘති කාලසීමාවෙන් එක් වර්ෂයක් ගතවී තිබුණද, 2024 වර්ෂය සඳහා ලබා දුන් අරමුදල් වලින් සියයට 32 ක් පමණ භාවිත නොකර ඉතිරිව තිබුණි. | සමාගමේ ඉහළ කළමනාකාරීත්වයේ වෙනසක් සිදුව තිබුණි. කෙසේ වුවද, 2025 ජූලි මාසයෙන් පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මූලික අදියරට සාපේක්ෂව මන්දගාමී වී ඇති බව නිරීක්ෂණය විය. | නියමිත කාල රාමුව තුළ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය විසින් 2023/2024 වර්ෂයන් තුළ වාහන කුලියට ගැනීම සඳහා රුපියල් මිලියන 35 ක වියදමක් දරා ඇති අතර, එම වාහන සෘජුවම මෙන්ම මහවැලි උපදේශන කාර්යාංශය (පුද්ගලික) සමාගම හරහාද ලබාගෙන තිබුණි. වාහන සැපයීම සඳහා තෝරාගත් එම සමාගමට අවශ්‍ය ධාරිතාව, පළපුරුද්ද, කාර්ය මණ්ඩලය හෝ භෞතික සම්පත් නොතිබූ අතර, එයට ප්‍රසම්පාදන අංශයක්ද නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන සහ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර වාහන කුලියට ගෙන තිබුණි. | කෙසේ වෙතත්, මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වීමට පෙර ව්‍යාපෘතිය එම්.සී.බී වෙතින් වාහන සේවා ලබාගෙන ඇති අතර, මෙම කටයුතු එම්.සී.බී ආයතනය සේවා සැපයුම්කරු ලෙස ඇති භූමිකාවට අනුකූලව සිදු කර ඇති අතර, ව්‍යාපෘති ලේඛනයට අනුව ව්‍යාපෘති මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ විමර්ශනයක් සිදු කර, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කළ වගකිවයුතු නිලධාරීන් හඳුනා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතිය විසින් විවිධ වර්ගයේ ජීප් රථ කුලියට ගෙන ඇති අතර, පෞද්ගලික සමාගමකින් 3000cc එන්ජින් ධාරිතාවයකින් යුත් ටොයෝටා ප්‍රාඩෝ එස්.යූ.වී රථයක් මාසිකව රුපියල් 920,000 කට (ඉන්ධන ඇතුළත්ව) කුලී පදනම මත ලබාගෙන ඇති අතර, 2023 ඔක්තෝබර් සිට 2024 අප්‍රේල් දක්වා කාලය තුළ ඒ සඳහා එකතුව රු. 7,106,880 ක මුදලක් ගෙවා තිබුණි. මෙම වාහනය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා වෙත අනුයුක්ත කර ඇති අතර, 2023 ඔක්තෝබර් මාසය සඳහා එම නිලධාරියාට රුපියල් 59,235 ක ඉන්ධන දීමනාවක්ද ගෙවා තිබුණි. මෙම වාහනය ලබාගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබූ අතර, වාහන කුලිය සම්බන්ධයෙන් ව්‍යාපෘතිය සහ එම සමාගම අතර කිසිදු ගිවිසුමක්ද ඇති කර නොතිබුණි. | ඒ අනුව, ව්‍යාපෘති ලේඛනයේ සඳහන් කර ඇති කොන්දේසි අනුව ව්‍යාපෘතිය විසින් මෙම සේවාවන් එම්.සී.බී වෙතින් ලබාගෙන ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ විමර්ශනයක් සිදු කර, ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කළ වගකිවයුතු නිලධාරීන් හඳුනා ගත යුතුය. |
| (ඇ) | එම්.සී.බී සහ වාහන සැපයුම්කරු අතර ඇති කරගත් ගිවිසුමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වාහන වර්ග, අවශ්‍ය ප්‍රමාණය හෝ මාසික කුලී මුදල සඳහන් කර නොතිබූ අතර, ඒවා සමාගම විසින් තීරණය කරනු ලබන බව සඳහන් කර තිබුණි. එම ගිවිසුම යටතේ සැපයූ වාහන ව්‍යාපෘති කටයුතු සඳහා පමණක් නොව සමාගමේ දෛනික කාර්යාල කටයුතු, වෙනත් ව්‍යාපෘති සහ අමාත්‍යාංශයේ/සභාපති කාර්යාලයේ කටයුතු සඳහාද භාවිතා කිරීමට නියමිතව තිබුණි. වාහන සැපයුම්කරු විසින් ඉදිරිපත් කළ ඉන්වොයිස්වල ගමන් කළ දුර, අතිකාල පැය සහ රාත්‍රී කාල පැය වැනි තොරතුරු පමණක් ඇතුළත් වී තිබූ අතර, අදාළ දිනවල ගමන් කළ ස්ථාන පිළිබඳ නිශ්චිත තොරතුරු සඳහන් | එම අවස්ථාවේදී ව්‍යාපෘති ආරම්භක වාර්තාව සහ මූලික සමීක්ෂණ වාර්තාව කඩිනමින් සකස් කළ යුතුව පැවතුණි. මෙම හදිසි අවශ්‍යතාව සහ මෙහෙයුම් අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘතිය එම්.සී.බී හරහා වාහන ලබාගෙන ඇති අතර, එහිදී කැබ් රථ දෙකක් (02), වෑන් රථයක් (01) සහ ජීප් රථයක් (01) කුලියට ගෙන තිබුණි.<br><br>තවද, 2024 වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා, ව්‍යාපෘතිය විසින් එම්.සී.බී වෙතින් අමතර කැබ් රථ දෙකක් (02) ඉල්ලා තිබුණි. | ඉල්ලා ඇති වාහන පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| කර නොතිබුණි. ඒ අනුව, වාහන ව්‍යාපෘති කටයුතු සඳහා පමණක් භාවිතා වූ බව තහවුරු කළ නොහැකි විය.<br>එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේදී රුපියල් මිලියන 6.64 ක් සහ 2024 වර්ෂයේදී රුපියල් මිලියන 18.16 ක් වාහන කුලී වියදම් ලෙස ගෙවීම් කර තිබුණද ඒවා ව්‍යාපෘතිය සඳහා පමණක් දරා ඇති වියදම් ලෙස විගණනයට පිළිගැනීමට නොහැකි විය. | | |

## 3.3. මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති මෙහෙයුම් ආරම්භයේදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය සඳහාවත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2025 නොවැම්බර් 28 වන විට, ව්‍යාපෘතිය ආරම්භ වී වසර දෙකකට වැඩි කාලයක් ගතවී තිබුණද, ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ ව්‍යාපෘති ගණකාධිකාරී තනතුරු වැඩ බලන පදනම මත පමණක් බඳවාගෙන තිබුණි. තවද, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ ව්‍යාපෘති ලේකම් තනතුරු ඍජුව ව්‍යාපෘතිය මඟින් බඳවාගෙන නොතිබූ අතර, රජය සතු සමාගමක් වන මහවැලි උපදේශන කාර්යාංශ (පුද්ගලික) සමාගම (එම්.සී.බී) හරහා සිදු කර තිබුණි. ඊට අමතරව, ප්‍රසම්පාදන විශේෂඥ, අධීක්ෂණ හා ඇගයීම් නිලධාරී සහ තාක්ෂණික නිලධාරී තනතුරු තවමත් පුරප්පාඩු වී තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන තිබුණද, ව්‍යාපෘතිය ආරම්භක අවස්ථාවේදී එම තනතුරු සඳහා පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේ අවශ්‍යතාව මත, අදාළ බඳවාගැනීම් අදියර තුනක් (03) යටතේ සිදු කර තිබුණි. | අවශ්‍ය කාර්ය මණ්ඩල ව්‍යුහය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් විධිමත් අනුමැතිය තවදුරටත් ප්‍රමාදයකින් තොරව ලබාගත යුතුය. තවද, ප්‍රධාන තනතුරු ස්ථිර පදනම මත බඳවාගැනීම කඩිනම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කළමනාකරණ සේවා චක්‍රලේඛ 2019/01 හි 2.3.2 වගන්තියට අනුව, ව්‍යාපෘතිය සඳහා පූර්ණ කාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කළ යුතු වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ වෙනුවට, වාරිමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉඩම් හා නීති) ලෙස සේවය කළ නිලධාරියෙකු 2023 අගෝස්තු 01 සිට 2024 ජූලි 31 දක්වා වැඩ බලන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙස පත් කර තිබුණි.<br>විගණිත දින වන 2025 නොවැම්බර් 28 වන විටද පූර්ණ කාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කර නොතිබූ අතර, එම නිලධාරියා තවදුරටත් වැඩ බලන පදනම මත එම රාජකාරී ඉටු කරමින් සිටි බව නිරීක්ෂණය විය. | මේ වන විට වාරිමාර්ග අමාත්‍යාංශයේ ව්‍යාපෘති පුද්ගල හා ප්‍රගති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති ලේඛනය සහ 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය සහ වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් ව්‍යාපෘති කාර්යාලයට පැහැදිලිව මඟ පෙන්වීම් ලබා තිබූ අතර, ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දැනටමත් අනුමත කර තිබියදී අනුමත ව්‍යාපෘති කාර්ය මණ්ඩලයෙන් ඉක්මවා අමතර කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පෙර අනුමැතිය ලබාගැනීම අවශ්‍ය විය. චක්‍රලේඛයේ 2.1.1 වගන්තියට අනුව, ව්‍යාපෘතියට සෘජුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම වෙනුවට, මහවැලි උපදේශන කාර්යාංශ (පුද්ගලික) සමාගම හරහා විවිධ තනතුරු සඳහා පුද්ගලයන් බඳවාගෙන තිබූ අතර, එමගින් චක්‍රලේඛයේ උපදෙස් වලින් විචලනය වී තිබුණි. විගණනය සඳහා ලබා දුන් තොරතුරු අනුව, 2025 දෙසැම්බර් 31 වන විට මෙලෙස බඳවාගත් නිලධාරීන් 87 දෙනෙකු සඳහා රුපියල් මිලියන 120.3 ක වැටුප් ගෙවා තිබුණි. | බඳවාගැනීම් සිදු කර ඇත්තේ නිශ්චිත රාජකාරි පැවරීමෙන් පසුව වන අතර, සේවා අවශ්‍යතා මත සේවා කාලය දීර්ඝ කර ඇත.<br><br>ව්‍යාපෘති ලේඛනයේ සඳහන් පරිදි, මහවැලි උපදේශන කාර්යාංශය උපදේශන සේවා ලබාගැනීම සඳහා නම් කර තිබුණි. ඒ අනුව, උපදේශන සේවා සඳහා හඳුනාගත් උපදේශකයින් කාර්යාංශය විසින් අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය අනුව පත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව ක්‍රියා කළ යුතුය. |